Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

**බියගම ප්‍රාදේශීය සභාව**

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු සඳහා බඳවා ගැනීම

01. බියගම ප්‍රාදේශිය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු පිරවීම සඳහා අදාළ සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම්* | | *වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද* | |
|---|---|---|---|---|---|---|---|
| | | | | *අභ්‍යන්තර (සීමිත)* | *බාහිර (විවෘත)* | *අභ්‍යන්තර (සීමිත)* | *බාහිර (විවෘත)* |
| 01 | ආදාහනාගාර ක්‍රියාකරු III (ප්‍රාථමික අර්ධ ශිල්පීය) | 02 | PL 2 - 2016 රු. 25,250 - 10 x 270 -10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,450 (රා.ප.ච. 03/2016 අනුව) | අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය/ 9 වසර සමත් විය යුතුය. | අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය/ 9 වසර සමත් විය යුතුය. | *වෘත්තීය සුදුසුකම් :*<br><br>ජාතික වෘත්තීය කුසලතාවන්හි (N.V.Q.) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් ලබා තිබීම හෝ අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ මාස 06කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම. (සහතික මගින් සනාථ කළ යුතුයි.)<br><br>*පළපුරුද්ද :*<br><br>පළාත් පාලන ආයතනයක ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරක සේවය ස්ථිර කර ඇති, සේවා කාලය වසර 05ක් සපුරා ඇති, අදාල කාර්යක්ෂමතා කඩඉම සමත්, වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති සේවකයකු විය යුතුය. | *වෘත්තීය සුදුසුකම්*<br><br>ජාතික වෘත්තීය කුසලතාවන්හි (N.V.Q.) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් ලබා තිබීම හා අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ මාස 06කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම. (සහතික මගින් සනාථ කළ යුතුයි.) |

02. *බඳවා ගැනීමේ ක්‍රමය :*

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී මූලික අධ්‍යාපන සුදුසුකම්වලට අමතරව ලබා ඇති අධ්‍යාපන සුදුසුකම්, තනතුරට අදාළ ප්‍රායෝගික දැනුම, කාලීන සිදුවීම් පිළිබඳ අවබෝධය, පෞරුෂත්වය යනාදිය සලකා බලනු අතර එහිදී වැඩිම ලකුණු ලබා ගත් අනුපිළිවෙලට අනුව බඳවා ගනු ලැබේ.

03. *වයස* .- අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවු. 18ට නොඅඩු අවු. 45ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අයට මෙම උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.

04. *වෙනත් සුදුසුකම්* :-

(i) අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචියෙන් ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

(ii) යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.

(iii) අයදුම්කරු ඉල්ලුම් පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03ක් අඛණ්ඩව බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. (ඡන්ද හිමි නාම ලේඛනයෙන් හෝ ග්‍රාම නිලධාරි/ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන සහතිකයකින් පදිංචිය සනාථ කළ යුතුය.)

(iv) රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ආයතන විසින් සේවයෙන් පහ කරනු ලැබූ අයෙකු නොවිය යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතුය.

(v) දණ්ඩ නීති සංග්‍රහය යටතේ අධිකරණය මගින් දඬුවම් පමුණුවනු ලැබූ අයෙකු නොවිය යුතුය.

(vi) අවශ්‍ය වෙතොත් සභාව විසින් නියම කරනු ලබන ඇපයක් මුදලින් හෝ රක්ෂණ සහතිකයක් මගින් තැබීමට සූදානම් විය යුතුය.

05. *පොදු කොන්දේසි* :-

(i) තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු අතර මනා පෞරුෂයකින් යුක්ත විය යුතුය,

(ii) මෙම පත්වීම ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතුය.),

(iii) තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්ය,

(iv) පරිවාස කාලය අවසානයේ ස්ථිර කිරීම සලකා බලනු ලැබේ,

(v) මුල් පත්වීම් දින සිට වසර 3ක් ගතවීමට පෙර කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය,

(vi) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට එකඟ විය යුතුය,

(vii) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුයි,

(viii) බඳවා ගැනීමෙන් පසුව ඔබ විසින් ඉදිරිපත් කර ඇති අධ්‍යාපන සුදුසුකම් හෝ වෙනත් සුදුසුකම් ව්‍යාජ හෝ අසත්‍ය බවට තහවුරු වුවහොත් වෙනත් කිසිම දැනුම්දීමකින් තොරව පත්වීම අවසන් කරනු ලැබේ,

(ix) මීට අමතරව ආයතන සංග්‍රහයේ විධිවිධානවලටද, මුදල් රෙගුලාසිවලටද, බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝගවලටද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර පනවනු ලබන වෙනත් නියෝගවලටද, දෙපාර්තමේන්තු නියෝගවලටද අනුකූලව කටයුතු කළ යුතුය.

06. *අයදුම්පත්* :- අයදුම්කරුවන් මෙම උපලේඛනයේ දැක්වෙන ආකෘතියට අනුව පිළියෙල කර ගත් අයදුම්පත් 2018.08.31 වැනි දිනට පෙර "ලේකම්, බියගම ප්‍රාදේශීය සභාව, දෙල්ගොඩ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "අයදුම් කරන තනතුර" සඳහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන හා තැපෑලේදී නැතිවන අයදුම්පත් පිළිබඳ වගකියනු නොලැබේ.

07. සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

08. අයදුම්පත් සමග පහත සඳහන් සහතික පත්වල පිටපත් අමුණා එවිය යුතු අතර සම්මුඛ පරීක්ෂණයේදී මුල් සහතික ඉදිරිපත් කළ යුතුය.

*(අ)* උප්පැන්න සහතිකය,

*(ආ)* අධ්‍යාපන සහතිකය,

*(ඇ)* ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක්,

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරි විසින් නිකුත් කළ පදිංචිය සනාථ කිරීමේ සහතිකය,

*(ඉ)* මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක්, (එකක් පදිංචි වසමේ ග්‍රාම සේවා නිලධාරිගෙන්)

*(ඊ)* වෘත්තීය පළපුරුද්ද හා වෙනත් සුදුසුකම් දැක්වෙන සහතික,

*(උ)* දැනටමත් සේවයේ යෙදෙන බවට දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය.

09. මෙම අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ ඒ අතරතුර හෝ බස්නාහිර පළාතේ මෙම තනතුරුවලට අදාළ නව බඳවා ගැනීමේ පරිපාටි, ව්‍යවස්ථා සංශෝධනයවීම සහ ව්‍යවස්ථා ආදේශ කිරීමද, බඳවා ගැනීම් ප්‍රමාද කිරීම්, වෙනස් කිරීම්, සහ මෙම නිවේදනය අවලංගු කිරීම ආදී සියලු බලතල බියගම ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු වන්නේය.

වසන්ති වික්‍රමරත්න,
ලේකම්,
බියගම ප්‍රාදේශීය සභාව.

2018 ක් වූ අගෝස්තු 02 වැනි දින.

**ආදර්ශ අයදුම් පත්‍රය**

***බියගම ප්‍රාදේශීය සභාව***

1. අයදුම්කරුගේ නම/ (මුලකුරු සමග) :——————————.
   මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————————.
2. තැපැල් ලිපිනය:——————————. දු.ක. අංකය
3. උපන් දිනය : අවුරුද්ද :——————. මාසය:—————— දිනය:——————
4. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස : අවුරුදු:—————— මාස :—————— දින:——————
5. විවාහක/ අවිවාහක බව :——————————.
6. ජාතිය :——————————. :
7. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද? එසේ නම් පරම්පරාවෙන්ද? ලියාපදිංචි වීමෙන්ද? යන වග :——————————.
8. අධ්‍යාපන සුදුසුකම් :——————————.
9. වෘත්තීය සුදුසුකම් :——————————.
10. පළපුරුද්ද :

| ආයතනය | තනතුර | සේවා කාලය |
|---|---|---|
| ______ | ______ | ______ |

11. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් :
    (i) දැනට දරන තනතුර :——————————.
    (ii) එම තනතුරට පත්වූ දිනය :——————————.
    (iii) එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත්/පදනම මතද) :——————————.

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි ඒවා බව මම මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් දනිමි.

——————————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————.